# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
# பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
# MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය / தொலைபேசி: (94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணைத்தளம்: www.pubad.gov.lk / Web Site


---

මගේ අංකය / எனது இல / My No: CS/DOS/21/01/02

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2017.04.19

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,**

**සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,**

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තනතුරු වලට අයත් රාජකාරී සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ට පැවරීම</u>**

උක්ත මැයෙන් වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2013 හා ඊට අදාලව පසුව නිකුත් කර ඇති මගේ අංක PA/CS/POLICY/චක්‍රලේඛ හා 2016.04.25 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ සුවිශේෂී අවධානය කරවමි.

02. ඒ අනුව රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගේ රාජකාරී කටයුතු සංවර්ධන නිලධාරීන් වෙත නොපැවරිය යුතු බවට දන්වා ඇතත් ඇතැම් ආයතන විසින් ඊට පරිබාහිරව තවදුරටත් කටයුතු කරමින් සිටින බවට අදාළ වෘත්තීය සමිති විසින්ද පෙන්වා දී ඇත.

03. විශේෂයෙන් උපාධිධාරී යෝජනා ක්‍රමය යටතේ බඳවා ගත් සංවර්ධන නිලධාරීන් වෙත රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන යෝජනා ක්‍රමයන්ට අදාළව රාජකාරී කටයුතු පැවරෙන බැවින් එපරිදි එම නිලධාරීන් වෙත රාජකාරී පැවරීම සිදුකරන ලෙසත්, කළමනාකරණ සහකාර සේවයේ තනතුරු වලට අදාළ රාජකාරී කටයුතු හෝ වෙනත් සේවාවන්ට අදාළ රාජකාරී ඔවුන් වෙත පවරා ඇත්නම් එය නොපමාව නිවැරදි කරන ලෙසත්, එමෙන්ම එක් එක් සේවාවන් සඳහා සේවා ව්‍යවස්ථාවන්ට අනුව නිශ්චය කර ඇති රාජකාරී කටයුතු පමණක් පවරන ලෙසත් සියළු පාර්ශවයන් දැනුවත් කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

**ජේ.ජේ.රත්නසිරි**

**ලේකම්**

**රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය**

**පිටපත්:**

01. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - ඔබේ අංක SP/4/3 හා 2017.03.17 හා දිනැති ලිපිය අනුව අ.ක.ස
02. සභාපති, සමස්ත ලංකා රාජ්‍ය කළමනාකරණ සහකාර සංගමය - 2017.03.07 දිනැති ලිපිය අනුව අ.ක.ස.